සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය – 2020 (II)**

**කාලය: පැය 03**

**සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) - (15)**

විභාග අංකය
Index No / சுட்டெண்
.......................................

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. ජාතික සංවර්ධනයට හා මහජන අභිවෘද්ධියට අවැසි සේවාවන් සැපයීම සඳහා සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළ යුතු රාජ්‍ය සේවය තුළ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ කාර්ය භාරය විග්‍රහ කරන්න. (ලකුණු 20)

02. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට අදාළව පිළිපැදිය යුතු මූලධර්ම (Directive Principles) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදය මගින් දක්වා ඇත. ඉන් මූලධර්ම හතරක් (04) තෝරා ගනිමින් සැමට සාධාරණ වන පරිදි සංවර්ධන සැලසුම් හා ප්‍රතිපත්ති සැකසීමට හා ක්‍රියාවට නැංවීමට එම මූලධර්ම යොදා ගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 20)

03. සංවර්ධන සැලසුම් ක්‍රියාවට නැංවීමේදී සහ මහජන සුබසාධන කටයුතුවලදී පළාත් සභාවල දායකත්වය හා කාර්ය භාරය විස්තර කරන්න. (ලකුණු 20)

04. යහ පාලනය (Good Governance) යනු සාධනීය සංවර්ධන පරිපාලන ක්‍රියාවලියක තිබිය යුතු මූලධර්ම සමූහයකි. ඉන් හතරක් (04) තෝරාගෙන ඒවා මහජන හිතකාමී සංවර්ධන ක්‍රියාවලියක් සඳහා යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

05. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක රාජ්‍ය ව්‍යවසායන් (State Owned Enterprises (SOEs)) 400 ක් පමණ වේ.

i. රාජ්‍ය ව්‍යවසායන්තුනක් (03) නම් කරජ්වා මගින් ඉටු කරනු ලබන කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

ii. රාජ්‍ය ව්‍යවසායන්වල පාලනය පිළිබඳව රාජ්‍ය යාන්ත්‍රණයේ ව්‍යවස්ථානුකූල ප්‍රතිපාදන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. පෞද්ගලික අංශයට සාපේක්ෂව රාජ්‍ය සංස්ථාවල කාර්යක්ෂමතාව පහළ මට්ටමක පවතින බවත් එබැවින් ඒවායෙහි කාර්යක්ෂමතාව වර්ධනය කළ යුතු බවත් විවිධ මත පළවී ඇත. මෑත කාලීනව ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධව සාකච්ඡා වෙමින් පවතින රාජ්‍ය සංස්ථාවක් / ව්‍යවස්ථාපිත මණ්ඩලයක් උදාහරණයට ගනිමින් එම ආයතනයේ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කළ හැකි ආකාරය විග්‍රහ කරන්න. (ලකුණු 06)

06. සංවර්ධිත රටක් ගොඩ නැගීමේ දී ග්‍රාමීය සංවර්ධනය සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කිරීම වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.මේ සඳහා පහතආයතනවල දායකත්වය ලබා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

අ. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පාලන (Regional Administration) ආයතන (ලකුණු 10)

ආ. මහජන සංවිධාන (ලකුණු 10)

*************